සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 47 S I,II

නම: ........................................ සිංහල සාහිත්‍ය රසාස්වාදය - I කාලය පැය තුනයි

## I - පත්‍රය

- මෙම කොටසට පිළිතුරු සපයා වෙනම භාරදෙන්න.

(01) i සිට v තෙක් කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I. "මුඹ දුන් ගිය මැනව. මම රඳමි"
   (අ) මේ ප්‍රකාශය කළේ කවරෙක්ද? ..............................
   (ආ) ප්‍රකාශය කළේ කා හටද? ..............................

ii. "හා...... හා....... ඕක පැත්තකින් තියපං. ඒක විතරයි උඹට මාමාගෙන් තවම ඉගනගන්න බැරිඋනේ"
   (අ) මෙහි කියවෙන ඉගෙන ගන්න බැරිඋන දේ කුමක්ද? ..............................
   (ආ) මෙම කොටස අයත් ග්‍රන්ථයේ නම ලියන්න. ..............................

iii. "යාළුවා දුන් වෙලාව කීයට ඇද්ද"
   (අ) මෙසේ ප්‍රකාශ කළේ කවුද? ..............................
   (ආ) පිළිතුරු දුන් තැනැත්තා අනතුරුව කුමක් කළේද? ..............................

iv. "කුමක් නිසා තෝ මෙතැනට ආයෙහි දැයි"
   (අ) මෙසේ පැවසුවේ කවුද? ..............................
   (ආ) මෙහි සඳහන් තෝ යනු කවුද? ..............................

v. "පැයකදී එකට හමුවන දුර ඈත දෙතැන - මෙය වෙන්කරනු හැකි කිසිවකු වෙද කොතැන"
   (අ) මෙම පද්‍ය කොටස අයත් පද්‍ය නිර්මාණය සඳහන් කරන්න. ..............................
   (ආ) එය රචනා කළේ කවුද? ..............................

(ලකුණු 4×5 20)

(02) පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

"ස්වාමීනි" මුඹ වහන්සේ දෙව්ලොව වැඩි ගමනේ දෙවඟනන් පන්සියයක් මා ලබන නියාවට වූ ඇපයෙක් ඇත්තේ වේද මෙවක් පටන් දෙවඟනන් තබා කිසිවකත් මාගේ ඇල්මක් නැති හෙයින් ඒ ඇප නැතැයි කී සේක. බුදුහු ඒ අසා වදාරා නන්දයෙනි, තොප රහත් වූ නියාව අපිත් දතුම්හ. දේවතාවකුත් අවුත් අපට කිව. එසේ හෙයින්, තොප කීවාත් නොකීවාත් අපි ඒ ඇපයෙන් මිදුණාම්හ' යි වදාරා රහත්ව ශෝභාවත්වූ මුහුණ ඊටම තබා ශෝභාමත් කරවූ සේක. වහන්දෑ ගොසින් රහත් නියාව නොදන ''කුමක්ද පෙර සිතන්නේ සිවුරු හරනට වේද? දැන් කුමක්දැයි'' විචාරා ''මා ගිහිවිටෙහි ආලයෙන් නැතැ''යි කී කල්හි මූ ගිහි විටෙහි ආලයක් නැති නියාවට කියති. මුත් බොරු කියන නියා වේදැයි බුදුන්ට එපවත් දන් වූ සේක.

බුදුහු ඒ අසා මහණෙනි යම් සේ සෙවිලි නොදක්මෙන් නපුරු කොට සොයා ලූ ගෙයි වැසි නැති විටෙක මුත් වැස්ස වට විටම තෙමේද එ පරිද්දෙන් සමථ භාවනා, විදර්ශනා භාවනා නැමැති සෙවිල්ල නො දන්නා හෙයින් තදංග විමුක්ති නැමති එක් තරම් සෙවිල්ලකින් සොයාලූ සිත් නැමැති ගෙයක් කෙලෙස් නැමැති එක් තරම් වැස්සක් වටත් තෙමී මුත් නොහැකිවේය."

i. මෙහි සඳහන් ඇපය කුමක් ද?
   ..............................
   .............................. (ලකුණු 04)

ii. ගිහි වීමට ඇති ආලය අත් ඇරියේ කවුරුන්ද ? එසේ අත් ඇරියේ ඇයි?

.................................................................................................................................

................................................................................................................................. (ලකුණු 04)

iii. මෙහි සඳහන් සිත් නැමැති ගෙය කෙලෙස් වැස්සෙන් නොතෙමෙන අයුරු දක්වන්න.

.................................................................................................................................

................................................................................................................................. (ලකුණු 06)

iv. ධර්මසේන හිමියන් භාවිත රචනා ශෛලිය මේ කොටස ඇසුරෙන් පැහැදිලි කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

................................................................................................................................. (ලකුණු 06)

නැතහොත්

ගොඩේ කන්දෙ මූකලාන කම්පා කරමින්නේ
රූස්සයෙකි රැ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙම පත් පැදුරට උණු කඳුලක් වැටුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයෙකු වාගේ කන්ද නැගී ඉන්නේ

පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැලිලා මාසයක්ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුං හුං ලනවා

පොරොව කියත කලුවරේම පණ ආවා ලෙසිනේ
මාගෙ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ
දෙයියන්ගේ මල්ලිලාට දෙයියොම රැවටෙන්නේ
කාන්තාරගම මායිම් තවත් පුළුල් වෙන්නේ

i. මෙම කවි පෙළට වස්තු විෂය වීඇත්තේ කුමක් ද?

.................................................................................................................................

................................................................................................................................. (ලකුණු 04)

ii. කවිපෙළ තුළින් හඳුනාගත් කාව්‍යෝපක්‍රම දෙකක් නම් කරන්න.

.................................................................................................................................

................................................................................................................................. (ලකුණු 04)

iii. කවියා යොදාගත් භාෂාව කොතෙක් දුරට ගැළපේ ද?

.................................................................................................................................

................................................................................................................................. (ලකුණු 06)

iv. "දෙයියන්ගේ මල්ලිලාට දෙයියොම රැවටෙන්නේ" යන පදයෙන් කියවෙන අදහස කුමක් ද?

.................................................................................................................................

.................................................................................................................................

................................................................................................................................. (ලකුණු 06)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 47 S I,II

නම: ..........................................

සිංහල සාහිත්‍ය රසාස්වාදය - II

## II පත්‍රය

- **පළමුවන ප්‍රශ්නයද 2, 3, 4 5 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**
- **මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන කඩදාසි භාවිත කරන්න.**

**(01) පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන වචන 200 කින් පමණ රසාස්වාදයක් ලියන්න.**

පෙරදිග ගොරහැඩි රකුසෝ
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදාගන්න පොරොවා ගත්ත
කළු රෙදි පොට
මොකටද මේ
තීරුවලට ඉරා දමන්නේ

කුරුල්ලන්ට ගල්ගහලා
උන් හොඳට ම බිය කරලා
මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුළු හෙළනවා

ඇස් දෙක මම අරින්නෙ නෑ
තුරුලු කරන් භාවනාව
නැවතත් යන්නට යනවා
මම
මගේ දැහැන ලෝකයට ම

අ) කවි පන්තියේ වස්තු විෂය
ආ) කවියා යොදාගත් කාව්‍යෝක්ති
ඇ) කවියා යොදාගත් භාෂාව
ඉ) ආකෘතිය
උ) කවි පන්තියේ අපූර්වත්වය (ලකුණු 6×5=30)

(02) පුද්ගල මනෝභාවයන් නිරූපණය කිරීමට අවස්ථා හා සිද්ධි ගැළපෙන ලෙස යොදාගත්ආකාරය "වැලපීම" කෙටි කතාවෙන් උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(03) විවිධ මිනිස් දුර්වලතා හාස්‍ය හා උපහාසය ධ්වනිත වන අයුරින් ඉදිරිපත්කරන ආකාරය "සුභාෂිතය" පද්‍ය ඇසුරින් උදාහරණ තුනක් දෙමින් විමසන්න. (ලකුණු 15)

(04) රසවිඳින්නා තුළ අපූර්ව චිත්ත රූප මැවීමට කුස ජාතක කතාකරුවා තුළ වූ සමත්කම නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(05) "ගැඹුරු දහමක් රසවත් කතාවක් තුළින් ඉස්මතු කිරීමට සද්ධර්මරත්නාවලි කතුහිමියෝ සමත් වෙති." නන්ද තෙරුන් වහන්සේගේ කතා වස්තුව ඇසුරින් උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)